# ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය
# டிஜிட்டல் பொருளாதார அமைச்சு
# Ministry of Digital Economy

1101, 11 වන මහල, වන් ගෝල් ෆේස්, # 1ඒ, මැද පාර, කොළඹ 02
1101, 11 வது மாடி, வந் கோல் பேஸ், # 1A, சென்டர் வீதி, கொழும்பு 02
Unit 1101, 11th Floor, One Galle Face Tower, # 1A, Centre Road, Colombo 02

/modesrilanka
mode.gov.lk


<u>මාධ්‍ය නිවේදනය</u>

## පුද්ගලික දත්ත ආරක්ෂණ සංශෝධන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය අනුමැතිය

**2025 මාර්තු 18 දින**

2022 අංක 9 දරන පුද්ගලික දත්ත ආරක්ෂණ පනත (PDPA) සංශෝධනය කරමින් පාර්ලිමේන්තුවට පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීම සඳහා ඩිජිටල් ආර්ථික අමාත්‍යවරයා ලෙස ජනාධිපතිතුමන් විසින් 2025 මාර්තු 17 වන දින අමාත්‍ය මණ්ඩලය විසින් සංදේශයක් ඉදිරිපත් කරන ලදී. පුද්ගලික දත්ත ආරක්ෂණ (සංශෝධන) පනත් කෙටුම්පත සකස් කිරීම සඳහා නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවට බලය පවරමින් මෙම අමාත්‍යාංශය විසින් මීට පෙර ප්‍රකාශයට පත් කරන ලද 2025 පෙබරවාරි 19 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අනුකූලව මෙය සිදු කෙරේ.

පුද්ගලික දත්ත ආරක්ෂණ පනත ක්‍රියාත්මක කිරීමට පෙර අත්‍යවශ්‍ය යැයි සැලකෙන මෙම සංශෝධන, අනාගතයට සූදානම් බලාත්මක කිරීමේ තන්ත්‍රයක් තිබීමේ වැදගත්කම හඳුනා ගනිමින්, රාජ්‍ය හා පෞද්ගලික අංශ දෙකටම ඩිජිටල් උපායමාර්ග අනුගමනය කිරීමට සමානව සහාය වීම සඳහා සහ දත්ත විෂයයන්ගේ අයිතිවාසිකම් අර්ථවත් ලෙස ආමන්ත්‍රණය කිරීම සඳහා, පුළුල් තාක්ෂණික තේරීම් වැළඳ ගැනීමට උපකාරී වනු ඇත. දත්ත ආරක්ෂණ අධිකාරිය විසින් ප්‍රකාශයට පත් කරන ලද කෙටුම්පත් රීති, කෙටුම්පත් රෙගුලාසි, කෙටුම්පත් නියෝග සහ කෙටුම්පත් මාර්ගෝපදේශයන්ට ප්‍රතිචාර වශයෙන් රාජ්‍ය අංශය, පෞද්ගලික අංශය සහ ප්‍රධාන පාර්ශ්වකරුවන්ගෙන් ලැබුණු වටිනා ප්‍රතිපෝෂණ මෙන්ම ගැටළු ද මෙම සංශෝධනවලට ඇතුළත් කර ඇති අතර, කෘත්‍රිම බුද්ධි (AI) පද්ධති යනාදිය භාවිතා කිරීමට හැකි වන පරිදි පුද්ගලික අංශයට සමාන තාක්ෂණික තේරීම් සිදු කිරීමේදී රාජ්‍ය අංශයට වඩාත් නම්‍යශීලී බවක් ලබා දෙයි.

පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට පෙර, මෙම සංශෝධන පනත් කෙටුම්පත සහ "නීතිය බලපෑමේ ප්‍රකාශය" මෙම අමාත්‍යාංශය විසින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

මෙම නීතිය මධ්‍යම රජයේ අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු මෙන්ම පළාත් සභා, පළාත් පාලන ආයතන, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ ග්‍රාම නිලධාරී මට්ටමින් ද එක සේ අදාළ වන බැවින්, ඊට අනුකූලතාව දැක්වීම සහතික කිරීම සඳහා වඩාත් ඉහළ මට්ටමේ මානව හා තාක්ෂණික ධාරිතාවක් නිර්මාණය කිරීමේ අවශ්‍යතාවය රජය අවබෝධ කරගෙන ඇත. මීට අමතරව, පනතේ බලාත්මක කිරීමේ විධිවිධානවලට සම්පූර්ණයෙන්ම අනුකූල වීම සඳහා අමතර කාලයක් අවශ්‍ය බව බොහෝ පාර්ශවකරුවන් ප්‍රකාශ කර ඇත. මෙම අවශ්‍යතා සැළකිල්ලට ගනිමින්, පනතෙහි අවශ්‍යතා සමඟ සම්පූර්ණයෙන්ම අනුගත වීමට ඔවුන්ට වැඩි කාලයක් ලබා දෙන අතර, දත්ත ආරක්ෂණ අධිකාරිය සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කරවමින් සියලුම පාර්ශවකරුවන් නිසි ලෙස සූදානම් කර ඇති බව සහතික කරමින්, බලාත්මක කිරීමේ දිනය මාස හයකට (06) නොඅඩු කාලයක් දක්වා දීර්ඝ කළ යුතු බවට අමාත්‍ය මණ්ඩලය තීරණය කර ඇත.

එබැවින්, 2024 ජනවාරි 8 වන දින නිකුත් කරන ලද අංක 2366/08 දරන අතිවිශේෂ ගැසට් නිවේදනයට අනුව, මුලින් 2025 මාර්තු 18 වන දිනට නියම කර තිබූ පනතෙහි බලාත්මක කිරීමේ දිනය, 2025 මාර්තු 14 වන දින නිකුත් කරන ලද අංක 2427/34 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය මගින් නිසි ලෙස සංශෝධනය කර ඇත. සංශෝධන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුව විසින් බලාත්මක කළ පසු නව බලාත්මක කිරීමේ දිනයන් නිසි ලෙස ප්‍රකාශයට පත් කෙරෙනු ඇත.


දුරකථන / தொலைபேசி / Telephones – +94112334562
ෆැක්ස් / பெக்ஸ் / Fax – +94112334576
ඊ-තැපැල / மின் அஞ்சல் / E-mail – info@mode.gov.lk

මෙම පනත බලාත්මක කිරීමේ දිනයන් ප්‍රකාශයට පත් කරන තෙක් දත්ත ආරක්ෂණ අධිකාරිය විසින් පැමිණිලි විමර්ශනය කිරීම, අභියාචනා ආදිය විභාග කිරීම සිදු නොකරනු ඇතත්, ඩිජිටල් ආර්ථිකයේ වර්ධනය සහ නවෝත්පාදනය අරමුණු කරගත් පහසුකම් සැලසීමේ කාර්යයේ දී ඩිජිටල් අවකාශයේ විශ්වාසය ගොඩනැගීම සඳහා අදාල ක්‍රියාවලීන් පනතෙහි විධිවිධානවලට අනුකූලව සකස් කර ඇති බව සහතික කිරීමට මෙම දීර්ඝ කරන ලද අතිරේක කාල සීමාව යොදා ගන්නා ලෙස පුද්ගලික දත්ත හා සම්බන්ධ දත්ත පාලකයන් හා සැකසුම්කරුවන් වශයෙන් කටයුතු කරනු ලබන රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතන වෙතින් ඉල්ලා සිටිනු ලැබේ.



**වරුණ ශ්‍රී ධනපාල**
**ලේකම් (වැ.බ.)**
**ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය**